සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**තෙවන වාර පරීක්ෂණය**
**மூன்றாம் கால சோதனை - 2026**
**Third Term Test**

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

1. i. අන්තර්ජනා‍ය බලවේග හා බහිර්ජනා‍ය බලවේග යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

   ii. නිම්න ග්ලැසියර් ඛාදන ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

   iii. මහද්වීප ග්ලැසියර් ඛාදිත භූ රූප තුනක් නිර්මාණය වන ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

   iv. ග්ලැසියර්වල ආර්ථික වටිනාකම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

2. i බියෝමයක් යනු කුමක්ද? (ලකුණු 02)

   ii බියෝම වර්ග 4ක් නම් කර, එයින් ඒක් බියෝමයක ව්‍යාප්තිය හා දේශගුණය යන අංග පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

   iii ශ්‍රී ලංකාව තුළ තෙත් බිම් පරිසර පද්ධතියේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

   iv වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති මුහුණ පාන ගැටළු තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

3. i පද්ධතියක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

   ii පද්ධතියක ශක්තිය හා පදාර්ථ හුවමාරුවීමේ ස්වභාවය අනුව පද්ධති වර්ග තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

   iii වායුගෝලීය පද්ධතියේ ප්‍රධාන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv හෞම පද්ධතියේ නිරන්තර ක්‍රියාකාරිත්වයෙන් යුත් උප පද්ධතියේ පැවැත්මට හානි කරන මානව ක්‍රියා තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

4. i. ස්වාභාවික උපද්‍රවය හා ස්වාභාවික ආපදාව අතර වෙනස ලියා දක්වන්න. (ලකුණු 02)

ii. නියඟ උපද්‍රවයක් ආපදාවක් වීමට තුඩු දෙන සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

iii. ස්වාභාවික උපද්‍රවය තීව්‍ර කිරීම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv. ආපදා කළමණාකරණ චක්‍රයෙහි අවස්ථා උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5. ලෝකයේ ප්‍රධාන කලාප අනුව වර්ගීකරණයේ ව්‍යාප්තිය (1950 – 2025)

| කලාපය | මුළු ජන සංඛ්‍යාවෙන් නාගරික ජන සංඛ්‍යාව % | | | | |
|---|---|---|---|---|---|
| | 1950 | 2000 | 2015 | 2020 | 2025 |
| ලෝකය | 29.6 | 46.7 | 53.9 | 56.2 | 68.4 |
| සංවර්ධිත රටවල් | 54.8 | 74.2 | 78.1 | 79.1 | 86.6 |
| සංවර්ධනය වන රටවල් | 17.7 | 40.1 | 49.0 | 51.7 | 65.6 |
| අප්‍රිකාව | 14.3 | 35.0 | 41.2 | 43.5 | 58.9 |
| ආසියාව | 17.5 | 37.5 | 48.0 | 51.1 | 66.2 |
| ලතින් ඇමරිකාව හා කැරිබියන් දූපත් | 41.3 | 75.5 | 79.9 | 81.2 | 87.8 |
| යුරෝපය | 51.7 | 71.1 | 73.9 | 74.9 | 83.7 |
| උතුරු ඇමරිකාව | 63.9 | 79.1 | 81.6 | 82.6 | 89.0 |
| ඕෂනියාව | 62.5 | 68.3 | 68.1 | 68.2 | 72.1 |

i. නාගරීකරණය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02)

ii. ඉහත වගුවට අනුව අවකාශීය වශයෙන් නාගරික ජන සංඛ්‍යාවේ වෙනස්වීම් පිළිබඳව කරුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 06)

iii. නාගරීකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන කරුණු 3ක් විස්තර කරන්න. (ලකුණු 06)

iv. සංවර්ධනය වන රටවල නාගරීකරණය ආශ්‍රිත උද්ගත වී ඇති ගැටළු තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

6. i. ජෛන්ද්‍රීය කෘෂිකර්මාන්තය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. නිෂ්පාදනයේ ප්‍රසාරණය සඳහා ලෝක මට්ටමින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

iii. වගාබිම් සඳහා ජලය සපයන ක්‍රම තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

v. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මුහුණ දෙන අභියෝග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

7. i. ආකර කැනීම සිදුකරන ක්‍රම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

ii. පෙට්‍රෝලියම් නිෂ්පාදනය, ව්‍යාප්තිය, වෙළඳාම යන අංශ පිළිබඳ කරුණු දෙක බැගින් විස්තර කරන්න. (ලකුණු 06)

iii. ආකර කර්මාන්තය ආශ්‍රිත ගැටලු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv. ඛනිජ සම්පත් උපයෝජනයේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන පාරිසරික බලපෑම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

8. i. නිෂ්පාදන කර්මාන්ත හා නිෂ්කර්ෂක කර්මාන්ත කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. නිෂ්පාදන කර්මාන්ත ස්ථානගතවීමට බලපාන සාධක තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්තය ආර්ථිකයට දක්වන දායකත්වය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv. ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය සංවර්ධනයට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)